ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

# මාධ්‍ය නිවේදනය

<u>මන්නාරම සහ මුලතිව් දිස්ත්‍රික් රෝහල්වල ඉන්දීය ප්‍රදාන ව්‍යාපෘතීන් සඳහා මුල්ගල් තැබේ</u>

2026 සැප්තැම්බර් 16 වන දින ශ්‍රී ලංකා ජනාධිපති අතිගරු අනුර කුමාර දිසානායක මැතිතුමා සහ සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය ගරු නලින්ද ජයතිස්ස මැතිතුමා විසින් මන්නාරම දිස්ත්‍රික් මහා රෝහලේ හදිසි අනතුරු සහ හදිසි ප්‍රතිකාර ඒකකය ඉදිකිරීම සහ මුලතිව් දිස්ත්‍රික් මහා රෝහලේ සිව් මහල් වෛද්‍ය වාට්ටු සංකීර්ණයක් ඉදිකිරීම සඳහා මුල්ගල් තබන ලදී.

2. උතුරු පළාත් ආණ්ඩුකාර ගරු නාගලිංගම් වේදනායගන් මැතිතුමා; ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්; සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු නිලධාරීන් සහ පළාත් පරිපාලනයේ මහ ලේකම්වරුන් සහ නිලධාරීන් ඇතුළු රැසක් මෙම අවස්ථාවන් සඳහා සහභාගී වූහ.

3. මෙම ව්‍යාපෘතීන් ඉන්දීය රජයේ ශ්‍රී ලංකා රුපියල් මිලියන 600 බැගින් වන ප්‍රදානයන් දෙකක් එනම් සමස්තයක් වශයනේ ශ්‍රී ලංකා රුපියල් බිලියන 1.2ක ප්‍රදානයක් යටතේ සිදු කෙරේ. මන්නාරම ව්‍යාපෘතිය යටතේ ස්වර්ණමය පැය තුළ ප්‍රදේශයේ ජනතාවට අවශ්‍ය හදිසි වෛද්‍ය ප්‍රතිකාර ලබා දීම සඳහා දෙමහල් හදිසි අනතුරු සහ හදිසි ප්‍රතිකාර ඒකකයක් ඉදිකිරීම සහ අවශ්‍ය වෛද්‍ය උපකරණ ලබා දීම සිදු කෙරේ. මෙම ව්‍යාපෘතිය සඳහා වන අවබෝධතා ගිවිසුමට 2025 සැප්තැම්බර් මාසයේදී අත්සන් තබන ලදී.

4. මුලතිව් මහ රෝහල සඳහා අවශ්‍ය අංගෝපාංගයන්ගෙන් සමන්විත සිව් මහල් වෛද්‍ය වාට්ටු සංකීර්ණයක් ඉදි කෙරේ. මෙය රෝග විනිශ්චය පුළුල් කිරීමට අතර බෝ නොවන රෝග හේතුවෙන් සිදු වන අකල් මරණ සහ වෙනත් රෝහල් වෙත යොමු කිරීම් අවම කිරීමට ඉවහල් වේ. මෙම ව්‍යාපෘතිය සඳහා වන අවබෝධතා ගිවිසුම ඉන්දීය උප ජනාධිපති අතිගරු සී. පී. රාධාක්‍රිෂ්ණන් මැතිතුමාගේ 2026 අප්‍රේල් ශ්‍රී ලංකා සංචාරය අතරතුර අත්සන් තබන ලදී.

5. මමෙ ව්‍යාපෘතීන් ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය ක්ෂේත්‍රය තුළ ඉන්දියාව විසින් ක්‍රියාත්මක කරනු ලබන ඉහළ ධනාත්මක බලපෑමක් සහිත සංවර්ධන සහයෝගිතා මුලපිරීම් දකෙකි. ඉන්දියාව විසින් එවන් මුලපිරීම් රැසක් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කර තිබෙන අතර දිවයින පුරා ක්‍රියාත්මක 1990 සුව සැරිය ගිලන් රථ සේවය; කොවිඩ්-19 වසංගත කාලය අතරතුර ලබා දුන් වෛද්‍ය සහය; දික්ඔය ඉදිකළ ඇඳන් 150ක බහු විශේෂ රෝහල; යාපනය ශික්ෂණ රෝහල සහ කිලිනොච්චි සහ මුලතිව් දිස්ත්‍රික් මහා රෝහල් වැඩි දියුණු කිරීම සහ ඒවා සඳහා සහය ලබා දීම සහ මඩකලපුව ශික්ෂණ රෝහලේ ශල්‍ය ඒකකය ඉදිකිරීම ඒ අතරින් කිහිපයකි. ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 25 පුරාම ක්‍රියාත්මක ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර සංවර්ධන සහයෝගීතාවය ඇමරිකානු ඩොලර් බිලියන 7.5කට අධික අතර ඉන් ඇමරිකානු ඩොලර් මිලියන 880ක් ප්‍රදාන වේ.

***

**කොළඹ**

***2026** සැප්තැම්බර් **16***